Article 12 (1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2019-12-04 |

පැමිණිලි අංකය : ඩී.සී. ජයංගනී මිය,
අංක 51/21, ශ්‍රී විපුලසේන මාවත,
කොළඹ 10.

වගඋත්තරකරුවන් : 01 විදුහල්පති,
ආනන්ද විද්‍යාලය,
කොළඹ 10.

02 ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

<u>පැමිණිලි අංකය : HRC/136/19</u>

පෙත්සම තුලින් දක්වා ඇති කරුණු =:

ඉහත සදහන් දොඩන්තලගේ වතුරි ජයංගනී යන අය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් දක්වා ඇත්තේ, තම පුත්‍රයා වන බී.එච්.පී.එස්. පෙරේරා යන අය 2019 වසරේ වගඋත්තරකාර පාසලේ පලමු වසරට ඇතුලත් කිරීම සදහා ගෘහ මූලික පදනම මත කොළඹ ආනන්ද විද්‍යාලයට අයදුම්පත්‍රය ඉදිරිපත් කර CO 620 යටතේ 2018-08-18 වන දින සම්මුඛ පරීක්ෂණය සදහා පෙනී සිටි බවත්, සම්මුඛ පරීක්ෂණයේදී තමාට හිමි මුළු ලකුණු ප්‍රමාණය 64.95 ක් ලෙස ලබාදී තිබූ බවත්, එම ලකුණු ලබා දුන් ලේඛනයට පැමිණිලිකාරිය විසින් අත්සන් තබන ලද බවත්ය. පැමිණිලිකාරිය තවදුරටත් සදහන් කරනුයේ, මෙම ගණය යටතේ ළමුන් ඇතුලත් කර ගැනීම සදහා වූ අවශ්‍ය ලකුණු ප්‍රමාණය ලබාදී තිබුණද කොළඹ ආනන්ද විද්‍යාලයේ පලමු වසරට සිසුන් ඇතුලත් කර ගැනීමට අදාළ තාවකාලික නාම ලේඛනයේ තම




| | | | |
|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04.<br>14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.<br>14, R. A. De Mel Mawatha, Colombo - 04. | සභාපති<br>தவிசாளர்<br>Chairperson | 011-2505451 |
| ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2505541 / 74 | ඊමේල්<br>மின்னஞ்சல்<br>e-mail | sechrc@gmail.com |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 94 -11- 2505580 / 81 / 82 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011-2505521 |
| ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 1996 | වෙබ්<br>இணையம்<br>Web | www.hrcsl.lk |

දරුවාගේ නම ඇතුලත් වී නොමැති බව දැනගැනීම මත අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයට අභියාචනයක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2018 දෙසැම්බර් මස 18 දින එකී අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය ඉදිරියේ පෙනී සිටි නමුත් අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය වෙතින්ද තමාට සාධාරණයක් ඉටුනොවූ බවද සඳහන් කර ඇත.

එසේම 24/2018 චක්‍රලේඛනය ප්‍රකාරව වගඋත්තරකාර පාර්ශවය විසින් ස්ථානීය පරීක්ෂණයක් සිදු කළ බවත්, එම අවස්ථාවේදී තමා හා පවුලේ අය නිවසේ නොමැතිවීම හේතු කොට ගෙන අදාල අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කළ නමුත් තමා උපන්දා සිට කොළඹ 10, ශ්‍රී විපුලසේන මාවතේ අංක 51/21 දරණ ස්ථානයේ පදිංචිව සිටින අතර එකී නිවසේ සිට පාසලට ඇත්තේ මීටර් 500 කට ආසන්න දුර ප්‍රමාණයක් බවද තම දරුවාට මේ වනවිටත් කිසිදු පාසලක් හිමිවී නොමැති බවද සඳහන් කර ඇත. ඒ අනුව තම දරුවාව 2019 වසරේ කොළඹ ආනන්ද විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුලත් කර ගැනීමට අවශ්‍ය කටයුතු සළසා දෙන ලෙසට මෙම පැමිණිල්ලෙන් ඉල්ලා ඇත.

**මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශනය =:**

මේ සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පරීක්ෂණයක් සිදුකර ඇති අතර, එම පරීක්ෂණය සඳහා 2019.03.25, 2019.05.17 සහ 2019.07.25 දින වල සහභාගි වන ලෙස පාර්ශවකරුවන්ට සිතාසි මගින් දැනුවත් කර ඇතත් එකී සිතාසි ප්‍රකාරව පැමිණිලිකාරිය පමණක් සහභාගි වී ඇත. වගඋත්තරකාර පාර්ශවය 2019.05.17 දින හැර අනෙකුත් දින වලදී සහභාගි වී නොමැත.

වගඋත්තරකාර පාර්ශවය විසින් ප්‍රකාශ කර ඇත්තේ, මෙම කාරණා පිළිබඳව තීරණයක් ගැනීම සඳහා මේ වනවිටත් අංක CO 620 දරණ ගොනුව අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කළ බවත් අමාත්‍යාංශය විසින් තවමත් මේ පිළිබඳව තීරණයක් ලබාදී නොමැති බවත්ය.

කෙසේ වෙතත් තවදුරටත් මෙම පැමිණිල්ල පිළිබඳ ප්‍රමාද කිරීම සාධාරණයක් නොවන හෙයින් ඊට අදාල නිර්දේශය නිකුත් කිරීමට කොමිෂන් සභාව තීරණය කර ඇත.

**කොමිෂන් සභාවේ නිරීක්ෂණ =:**

පැමිණිලි පාර්ශවය සහ වගඋත්තරකාර පාර්ශවය විසින් කොමිෂන් සභාව හමුවේ ඉදිරිපත් කොට ඇති සමස්ත කරුණු අනුව කොමිෂන් සභාව විසින් පහත නිරීක්ෂණ හඳුනාගෙන ඇත.

පැමිණිලිකාර දොඩන්තලගේ චතුරි ජයංගනී මහත්මියගේ අංක 5856 දරණ උප්පැන්න සහතිකය ග්‍රාම නිලධාරී විසින් 2018 ජූලි මස 02 වන දින නිකුත් කරන ලද ග්‍රාම නිලධාරී සහතිකය, 2013 වර්ෂයේ සිට පැමිණිලිකාරිය සහ ඇයගේ කලත්‍රයාගේ නම් සඳහන් ඡන්ද හිමි නාම ලේඛනය, 2012 ඔක්තෝබර් මස 03 වන දින පැමිණිලිකාරිය විවාහ වූ අංක 215 දරණ විවාහ සහතිකය, කොළඹ මහ නගර සභාව විසින් පදිංචිකරුවන්ට ලබා දෙන ලද තක්සේරු දැන්වීම්, පැමිණිලිකාරියගේ 2007-11-27 දින පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පතද, පැමිණිලිකාරියගේ ඉහත කී දරුවා වන බෙත්තර හෙට්ටිගේ පවන් සස්විරු පෙරේරාගේ අංක 4514 දරණ උප්පැන්න සහතිකයද පරීක්ෂා කිරීමේදී පැහැදිලිවම පෙනී යන්නේ පැමිණිලිකාරියගේ පදිංචි ස්ථානය මෙම අයදුම්පත්‍රය වගඋත්තරකාර පාසලට ඉදිරිපත් කිරීමේදී සඳහන් කළ එම ලිපිනය වන කොළඹ 10, ශ්‍රී විපුලසේන මාවත, අංක 51/21 දරණ ස්ථානයම වන බවයි.

මෙම ලේඛන මගින් පැහැදිලි වන්නේ, පැමිණිලිකාරිය උපන්දා සිටම ඉහත කී ස්ථානයේම පදිංචි වී සිටින බවට හා පැමිණිලිකාරියට තවදුරටත් ලේඛනයක් කූට ලෙස සෑදීමට කිසිදු අවශ්‍යතාවයක් නොමැති බවයි. තවද පැමිණිලිකාරිය වෙනත් ස්ථානයක පදිංචි වී සිටින්නේ නම් ඒ පිළිබඳව කොමිෂන් සභාවට ඔප්පු කිරීමේ කාර්යභාරය වගඋත්තරකාර පාර්ශවය සතු වන අතර වගඋත්තරකාර පාර්ශවය විසින් එය කිසිදු දිනක කොමිෂන් සභාව ඉදිරියේ ඔප්පු කර නොමැත. තවද මෙම පෙත්සම්කාර පාර්ශවය මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ පරීක්ෂණ සඳහා පෙනී සිටි අවස්ථා තුනේදීම ඇයගේ මාස කිහිපයක් වයසැති දෙවෙනි දරුවා ද සමඟ සහභාගී වී ඇති අතර එම දරුවා ලැබීමට ආසන්නයේ සහ දරුවා ලැබීමෙන් පසු දරුවා හෘද රෝගී තත්වයෙන් සිටි බැවින් ඒ සඳහා විශේෂඥ වෛද්‍යවරුන්ගෙන් ප්‍රතිකාර කළබව ඔප්පු කිරීමට අවශ්‍ය වෛද්‍ය ලේඛනද ඉදිරිපත් කර ඇත. පැමිණිලිකාරිය 2019-08-03 වන දින කොමිෂන් සභාවට ඉදිරිපත් කළ දිවුරුම් ප්‍රකාශය ප්‍රකාරව එකී දරුවා පෙළුනු හදවත් රෝගය හේතුවෙන් මිය ගිය බවටද කරුණු හෙළි වේ. එබැවින් පාසල විසින් ස්ථානීය පරීක්ෂණ සඳහා පැමිණි අවස්ථාවේ පැමිණිලිකාරිය සහ පවුලේ අය යම්කිසි අවශ්‍යතා සඳහා නිවසින් බැහැරව සිටීමට සාධාරණ හේතු ඇති බවත් පැමිණිලිකාරියගේ ස්ථිර පදිංචිය පිළිබඳව ඉහත කී ලේඛන පරීක්ෂා කිරීමේදී ඉතා පැහැදිලි වේ.

චක්‍රලේඛනය ප්‍රකාරව ගෘහ මූලික පදනම මත අයදුම්කරුවෙක් අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමේදී අයදුම්කරු ඉදිරිපත් කරන ලද ලේඛන නිවැරදි බව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් තීරණය කර ඇති අතර එම ලේඛන සඳහා ලකුණු ද ලබාදී තිබෙන බවත් ඒ සඳහා පැමිණිලිකාරිය අවශ්‍ය ප්‍රමාණයට වඩා ලකුණු ලබා ගෙන ඇති බවත් ඉතා පැහැදිලි වේ.

පැමිණිලිකාරිය විසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ ලේඛන පිළිබඳව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් කිසිදු අවස්ථාවක අභියෝගයට ලක් කර නොමැති අතර, එකී ලේඛන සත්‍ය බව නිරීක්ෂණය වීමෙන් අනතුරුව එම ලේඛන සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලකුණු ලබාදී ඇත. පැමිණිලිකාරිය විසින් ලබාගෙන ඇති ලකුණු ගෘහ මූලික පදනම මත ඇයගේ දරුවාව වගඋත්තරකාර පාසලට ඇතුළත් කිරීම සඳහා ඉතා ප්‍රමාණවත් බව පෙනේ. වගඋත්තරකරු විසින් එක් වතාවක් පමණක් ස්ථානීය පරීක්ෂණයක් සිදු කර එම අවස්ථාවේදී අයදුම්කරු එකී ස්ථානයේ නොසිටි බව කියා එම අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කිරීම කිසිසේත්ම සාධාරණ නොවන බව කොමිෂන් සභාවේ හැඟීමයි. චක්‍රලේඛනය තුළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට හා අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයට ස්ථානීය පරීක්ෂණ කිරීම සඳහා අනුමැතිය ලබාදී ඇතත් එකී ස්ථානීය පරීක්ෂණයේදී අයදුම්කරුවන් එහි ලිපිනයේ නොමැති වීම පමණක් එම ස්ථානයේදී එකී අයදුම්කරුගේ පදිංචිය සනාථ නොවන බවට තීරණයට එළඹීම සාධාරණ නොවන බව කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ. මෙම ප්‍රශ්නයේදී සැළකිය යුතු කරුණක් වන්නේ මෙම පෙත්සම්කාරිය මෙම සම්මුඛ පරීක්ෂණයට කැඳවූ අවස්ථාවේ සහ ගර්භනී තත්වයේ සිට මාස කිහිපයක් ඇතුළත ඇයගේ දෙවෙනි දරුවා ප්‍රසූත කර ඇති අතර, එකී දරුවාද මිය ගොස් ඇති බවයි. මේ අවස්ථාව තුළදී පැමිණිලිකාරිය ඇයගේ සහ දරුවාගේ සෞඛ්‍ය තත්වය මත විටින් විට නිවසින් බැහැරව සිටීමට බොහෝ ඉඩකඩ ඇති බවත් පෙනී යයි.

තවද පැමිණිලිකාරිය පදිංචි වී සිටින්නේ වගඋත්තරකාර පාසලට ඉතාම ආසන්නයේ බැවින් මෙම පාසල හැර වෙනත් කිසිදු පාසලක් පැමිණිලිකාරියට නොමැති බවද නිරීක්ෂණය වේ.

නිගමනය =:

ඉහත කී සියලු කරුණු කාරණා සලකා බැලීමේදී පෙනී යන්නේ, වගඋත්තරකාර පාසලට පෙත්සම්කාරියගේ දරුවාව 2019 වසරේ ගෘහ මූලික පදනම මත ඇතුළත් කිරීම සඳහා වූ සියලු සුදුසුකම් සපුරා ඇති නමුත් පැමිණිලිකාරිය විසින් ඉදිරිපත් කළ ලේඛන නිසියාකාරව වගඋත්තරකාර පාර්ශවයේ සැළකිල්ලට ලක්වී නොමැති වීම හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාවේ සඳහන් නීතිය ඉදිරියේ සමානත්වයෙන් සැළකීමේ අයිතිය වගඋත්තරකාර පාර්ශවය විසින් උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය =:

පෙත්සම්කාරියගේ දරුවා වන බෙත්තර හෙට්ටිගේ පවන් සස්විරු පෙරේරා දරුවාව 2019 වර්ෂයේ පළවන ශ්‍රේණියට හෝ අදාළ ශ්‍රේණියට ඇතුළත් කිරීමට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2019. 12. 27 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර. එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රමණී මුත්තෙට්ටුවේගම,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

එච්. ගසාලි හුසේන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :- 

1. ලේකම්,
   අධ්‍යාපන අමාත්‍යාංශය,
   ඉසුරුපාය,
   බත්තරමුල්ල.

2. ගරු අමාත්‍යතුමා,
   අධ්‍යාපන අමාත්‍යාංශය,
   ඉසුරුපාය, බත්තරමුල්ල.

B/